VIDUS 2-1-1

# මාංශ භෝග

*ඩෙරික් ශොක්මන්*

*අංශ ප්‍රධාන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රවෘත්ති සේවා අංශය*

ආහාර හා පෝෂණය පිළිබඳ ඒකාබද්ධ වැඩපිළිවෙලක දී තරගකාරී භෝග මෙන් නොව සහල් හා ධාන්‍ය වර්ග අනුපූරක භෝග වශයෙන් වගා කිරීමේ ක්ෂණික අවශ්‍යතාවයන් පැන නැග ඇත. මක්නිසාදයත් ධාන්‍ය වර්ග අඩු වියදමින් මාංශජනක ධාතු ලබාගත හැකි මාර්ගයක් වන අතර ඒවා බත් සමඟ ආහාරයට ගැනීමෙන් ලංකාවේ ජනයා ගනු ලබන ආහාරයේ ඌණව පවත්නා ලයිසීන් සහ ඇමයිනෝ අම්ල එහි අඩංගු බැවින් එම ඌණතාව නැති කරන හෙයිනි. අවාසනාවකට මෙන් කෘෂිකර්ම ප්‍රතිපත්තිය සහල් නිෂ්පාදනය වැඩි කිරීම කෙරේ පමණක් එල්ල කරන ලද අතර ධාන්‍ය වර්ග විශේෂයෙන් ම ඉන්දියාව සහ වෙනත් රටවලින් ආනයනය කරන ලදී. කෙසේ වුව ද රජය විසින් මෑත දී මුං ඇට, කඩල, රට කජු, කව්පි යනාදිය ආයාත කිරීම තහනම් කරනු ලැබීමත් කොල්ලු, රට පෝර යනාදිය ගෙන්වීමේ ප්‍රමාණය සීමා කිරීමත් හේතු කොට ගෙන මෙම ධාන්‍ය වර්ග රට තුළ වගා කිරීමට ගොවියාට සෑහෙන දිරිගැන්වීමක් විය.

## වැඩි දියුණු කළ භෝග වගාව

ඕනෑම ධාන්‍ය වර්ග සංවර්ධන වැඩ පිළිවෙලක දී පළමුව සැළකිල්ල යොමු විය යුත්තේ කෙටි කාල පරිච්ඡේදයක දී වඩා ඉහළ අස්වැන්නක් ලබා ගත හැකි දියුණු භෝග වර්ග යොද ගැනීම කෙරෙහිය. එවැනි ධාන්‍ය වර්ග දැන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක. එම්. අයි. 1, එම්.අයි. 4, විධි 59 මුං ඇට, ඒ අතුරින් ප්‍රසිද්ධ ඒවා වේ. මේ අතුරින් විශේෂයෙන් ම ආනයනය කරනු ලැබූ මයිසූර් පරිප්පු වලට ආදේශකයක් වශයෙන් ජනප්‍රියව ඇති එම්.අයි. 35 කව්පි සහ එම්. අයි. 4 සහ විධි 59 මුං ඇට, දින 60–70 අතර කාලයක දී අස්වැන්න නෙළා ගත හැක. එහෙත් ඒවා ප්‍රාදේශික ධාන්‍ය වර්ග වලට වඩා වැඩි අස්වැන්නක් ගෙන දේ.

## පොස්පේට් පොහොර යෙදීම

කෙසේ වුවද ගොවියා විසින් මීට පෙර හුරුපුරුදු වූ ක්‍රමයන්ට වඩා ඉහළ මට්ටමේ වගා ක්‍රම යොද ගැනීමට සූදනම් වීම මිස මෙම දියුණු කළ ධාන්‍ය වර්ගවලින් වැඩි පලදවක් ලබාගත හැකි නොවනු ඇත. ධාන්‍ය බෝග ‘‘ඉඩම් අයින්වල’’ වගා කරන ලදැයි යන්නෙන් එම භෝග වර්ග පොහොර වලට අනුකූලතාවයක් නොදක්වන්නේ යයි නොහැඟේවි. දියුණු කළ ධාන්‍ය වර්ග පොහොර කෙරෙහි කැපී පෙනෙන අනුකූලතාවයක් දක්වයි. විශේෂයෙන් ම නොසරු පසක් සඳහා ආරම්භයේ දී අක්කරයකට යටත්පිරිසෙයින් ඒකාග්‍ර කරනලද සුපර් පොස්පේට් හොණ්ඩර ½ ක් හා යූරියා හොණ්ඩර ½ ක් අවශ්‍ය වේ.

බොහෝ වගාවන් මෙන් නොව ධාන්‍ය වර්ග මූලකේෂ නිපදවීමට පසුබට වන හෙයින් එනම් ගසේ මුල්වල නයිට්‍රජන් තැන්පත් කරවන බැක්ටීරියා වර්ධනය වීම – මේ හේතුකොට ගෙන වර්ධනය බාලවේ. කෙසේ වුව ද මූලකේෂ දියුණු කිරීම සඳහා පොස්පේට් අත්‍යවශ්‍යයි.

දියුණු කළ භෝග වර්ග වගා කිරීමේ හැකියාවත් රජය විසින් අඩු මිලට පොහොර ලබා දීමේ ක්‍රමයත් සහ සහල් සමඟ ධාන්‍ය වර්ග ඇතුළත් කර වගාකිරීමේ ප්‍රකර්ශ ක්‍රමයක් ආරම්භ කිරීමට කාලය එළඹී ඇත. වී අස්වැන්න කපාගත් වහාම කෙටිකාලීන ධාන්‍ය වර්ග, අතුරු බෝගයක් වශයෙන් කුඹුරුවල සාර්ථක ලෙස වගා කළ හැකි ය. නැතහොත් වී කන්න දෙකක් අතර, අතර මැදි බෝගයන් වශයෙන් වගා කළ හැකි ය. මේවායේ කෙටි වයස් ප්‍රමාණයත් අඩු ජල ප්‍රමානයක් අවශ්‍යවීම නිසාත් වගා කිරීමට හැකි ය.

සැබැවින්ම ජල හිඟය හේතු කොට ගෙන සහල් වගාව කළ නොහැකි බිම් මෙම ධාන්‍ය වර්ග වගා කිරීමෙන් අඩු ජල ප්‍රමානයකින් සෑහීමකට පත්වීම තවදුරටත් ප්‍රයෝජනයට ගත හැකිවීමට හේතුවයි. මෙම හේතුව නිසා වියලි කලාපයේ යල් කන්නය තුළ පුරන්වීමට හැර ඇති අක්කර දහස් ගණන් ඇත. අනුරාධපුර සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල පමණක් අක්කර 200,000 ක් වේ. ඉන් සෑහෙන ප්‍රමාණයක් වැව් හෝ ලිං ජලය පාවිච්චි කිරීමෙන් සාර්ථක ලෙස ධාන්‍ය වගා කිරීමට හැකියාව තිබිය දී පුරන් වීමට ඉඩ හැර ඇති අති විශාල ඉඩම් ප්‍රමාණයකි.

අපට අයත් සීමා සහිත ඉඩම් සම්පත් සමඟ වටිනා පොහොර වර්ග වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට නම් මෙපරිදි වගා විවිධාංගීකරණය ඉතා අත්‍යාවශ්‍ය ය. වගාව සඳහා යොදනු ලැබූ පොස්පරස් සහ පොටෑසියම් පොහොරවල සාරය උරා ගැනීමෙන් ධාන්‍ය වර්ග පෝෂණය වේ. මේවා කරල් වීම නිසා නයිට්‍රජන් තැන්පත් කිරීමේ බැක්ටීරියාවල උපකාරයෙන් නයිට්‍රජන් යම් ප්‍රමාණයක් ද උපදවයි. වැඩිපුර නයිට්‍රජන් ප්‍රමාණයක් කන්න අවසානයේ දී වගා බිම්වල ඉපනැලි හැමෙන් පසු ඊලඟ වගාවට ප්‍රයෝජනවත් වේ.

තවද මේ නිසා අතිරේක වාසි ද ඇත. ධාන්‍ය වගාව සඳහා වල් පැලෑටි නෙලීම හේතු කොට ගෙන ඒ හා ඇති වී වගාවට එය වාසි දයකය, එනම් වල් පැලෑටි සම්බන්ධයෙන් හිරිහැර විය යුත්තේ ඉඩම් පුරන්ව තිබෙන්න හැරීමෙන් ඒ ගැන කරදරවිය යුතු ප්‍රමාණයට අඩුවෙනි. එහෙත් අනතුරුහැඟවීමක් දිය යුතුව ඇත! වී ගොවිතැනට පුරුදුව සිටි ගොවියා තම කුඹුරේ ධාන්‍ය ගොවිතැන් කිරීමේ දී පුරුද්දක් වශයෙන් ජලය ගලායෑමට සැලැස්වීමට වඩා කැමැත්තක් දක්වයි. ලියැදිවල ජලය බස්සවා බොහෝ වේලාවක් තුළ ජලය රැඳී සිටීමට සලස්වයි. මෙය වී ගොවිතැන සඳහා ඔබින නමුත් ධාන්‍ය වර්ග නිෂ්පාදනයේ දී අහිතකර වේ. කෙටි කාලීන ජලය රඳා සිටින අවස්ථාවේ දී පවා ධාන්‍ය පැලෑටිවල වර්ධනය ඉතාමත් බාලවේ. නැතහොත් එම්.අයි.35 කව්පි වගාවේදී නම් කරල් හැදීම බාල වී කොළ පමණක් විශාල වශයෙන් වර්ධනයවේ. ඒ අනුව ජලය සැපයීමේ හොඳම ක්‍රමය වන්නේ ජලය ගලායාමට සැලැස්වීම නොව දින 10–14 ක් පමණ සෑහෙන තරමින් ජලය සැපයීමයි.

ධාන්‍ය වගාවට බසින වී ගොවියා අතින් වල් පැලෑටි නෙලීමේ කාර්‍ය අතපසු වීම සිදුවීමට ප්‍රවනතාවයක් ඇත. කුඹුරුවලට ජලය ගලායාමට සැලැස්වීමෙන් වල් පැලෑටි මර්ධනය කිරීමට පුරුදුව සිටින වී ගොවියා කිහිප වරක් මඳ වශයෙන් ජලය සැපයීමේ දී සාමාන්‍යයට වඩා වැඩි වේගයකින්වල් පැලෑටි බෝවෙන බව ඔහුට අමතක විය හැක. මුල් මාස කීපය ඇතුලත දී මෙම වල් පැලෑටි මුලිනුදුරා නොදැමුවහොත් අවසානයේ දී එලදාව හීනවේ.

## වැඩි අස්වැන්න ලැබීම

එහෙත් එයට කරදරවිය යුතුද? ධාන්‍ය නිශ්පාදනයෙන් ලැබෙන ආදායම ගොවියා හුරු පුරුදු වත්මන් වගා ක්‍රම වෙනස් කිරීමට තරම් ඔහු උනන්දු කරවයිද? මෙතෙක් මේ පිළිබඳව සාර්ථකව ක්‍රම දක්වා ඇත. උදහරණ:— මුං ඇට වගාව ගනිමු. ජලය සැපයීම මගින් එක් අක්කරයකට මුං ඇට රාත්තල් 800-1000 ක් පමණ බලාපොරොත්තු විය හැක. රාත්තල රුපියල් තුන බැගින් විකිනීමෙන් රුපියල් 2400.00 රුපියල් 3000.00 ක් දක්වා මින් ආදායම ලැබිය හැක.

පොහොර, වල් පැලෑටි නාශක, කෘමිනාශක ආදිය සියළුම අමතර යෙදීම් ද සමඟ එවැනි වගාවන් සඳහා මුළුවියදම රුපියල් 1000.00 ඉක්මවිය යුතු නොවේ. මේ මගින් රුපියල් 1400.00 සිට රුපියල් 2000.00 දක්වා ශුද්ධ ලාභයක් ලැබෙනු ඇත. එය සහල් වලින් ලබන ආන්තික ලාභයට සමාන ලාභයක් හෝ සමහරවිට ඊට වඩා වැඩි ලාබයකි.